# 37 වසරක කාල පරිච්ඡේදය තුළ පර්යේෂණ හා පුහුණු ප්‍රගතිය

2009 වසරේ පෙබරවාරි මස 21 දිනට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට වසර 37ක් සම්පූර්ණ වේ. එම විශේෂිත අවස්ථාව සැමරීම සඳහා ආයතනයේ ත්‍රෛමාසිකව නිකුත් වන "ගොවි ජනතා" සඟරාවේ විශේෂ කලාපයක් නිකුත් කෙරේ. එම කලාපය සඳහා ලියවෙන මෙම ලිපියේ පරමාර්ථය වන්නේ ගෙවී ගිය තිස්හත් වසර තුළ කරන ලද පර්යේෂණ හා පුහුණු ප්‍රගතිය, එම පර්යේෂණ හා පුහුණු වැඩසටහන් තුළින් සිදු වූ සේවාව සහ ආයතනයේ ඉදිරි පර්යේෂණ හා පුහුණු ගමන් මඟ පිළිබඳව විමසා බැලීමකි.

පර්යේෂණයක් යනු යම් කරුණක් පිළිබඳව විද්‍යාත්මකව සොයා බලා නිගමනවලට පැමිණීමේ ක්‍රියාවලියකි. පර්යේෂණ අරමුණ පදනම් කර ගෙන මූලික පර්යේෂණ (Basic Research / Fundamental Research) සහ ප්‍රායෝගික පර්යේෂණ (Applied Research) ලෙස කොටස් දෙකකට බෙදේ. මූලික පර්යේෂණ මඟින් නව සොයා ගැනීම් සිදු කරනු ලැබේ. එක් අතකින් මෙම සොයා ගැනීම් නව නිෂ්පාදන විය හැකිය. එසේ නැතිනම් නව න්‍යායන් විය හැකිය. මූලික පර්යේෂණ මඟින් මූලික ගැටළුවලට (Fundamental Problems) විසඳුම් සෙවීමට වෙර දරන අතර ඒ සඳහා දිගු කාලයක් ගත වේ. ශ්‍රී ලංකාවේ වී පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය සහ උක් පර්යේෂණ ආයතනය කරනු ලබන්නේ මූලික පර්යේෂණයන් වේ. එකී ආයතන අඩු ඵලදායිතාව, කෘමි උවදුරු වැනි මූලික ගැටළුවලට විසඳුම් සොයාදීම සඳහා පර්යේෂණ සිදු කරනු ලබයි.

ප්‍රායෝගික පර්යේෂණ නැතිනම් සමාජ ආර්ථික පර්යේෂණ මෙයට හාත්පසින් වෙනස් ය. එකී පර්යේෂණවල අරමුණ වන්නේ සමාජයේ පවතින ප්‍රශ්නවලට විසඳුම් ඉදිරිපත් කිරීමයි. එසේ නැතිනම් ප්‍රශ්න විසඳීම සඳහා අවශ්‍ය තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයන්ට ලබා දීමයි. ගැටළු ඉක්මණින් විසඳීම අවශ්‍ය නිසා මෙම පර්යේෂණ සඳහා ගත වන කාලය මූලික පර්යේෂණ මෙන් දීර්ඝ නොවේ. එසේ දිගු කාලයක් ගතහොත් එම පර්යේෂණ වැදගත් නොවිය හැකිය. ප්‍රශ්නයේ ස්වරූපය වෙනස්වීම ඊට හේතුවයි. ප්‍රශ්නය බරපතල වුවහොත් වෙනත් පර්යේෂණයක් කිරීමට පවා සිදු වේ. මේ නිසා ප්‍රායෝගික පර්යේෂණ පැවැත්වීමේ දී කාලය ඉතා වැදගත් වේ. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 1972 දී පිහිටුවනු ලැබුවේ ගොවිජන හා ග්‍රාමීය ක්ෂේත්‍රයට අදළ ප්‍රායෝගික පර්යේෂණ පැවැත්වීම සඳහා ය. මෙම ආයතනය 1972 අංක 5 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාන ගත කර ඇති අතර ආයතනයේ අරමුණු, පනත තුළ ඉතා පැහැදිලිව පහත දැක්වෙන ආකාරයට විස්තර කර ඇත.

අ. ගොවිකටයුතු පර්යේෂණ ධෛර්යමත් කිරීම සහ සහාය දැක්වීම.

ආ. අනෙකුත් ආයතන දෙපාර්තමේන්තු විසින් සිදු කරනු ලබන ගොවිකටයුතු පර්යේෂණ සම්බන්ධීකරණය කිරීම.

ඇ. කෘෂිකාර්මික සංවර්ධනයට බලපාන ආයතනික සාධක පිළිබඳ විමර්ශනය කිරීම මෙන්ම පර්යේෂණ කිරීම.

ඈ. කෘෂිකාර්මික අරමුණු සඳහා ඉඩම් ආර්ථිකමය වශයෙන් ඵලදායි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශනය කිරීම, පර්යේෂණ කිරීම සහ අධ්‍යයනය කිරීම.

ඉ. කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධනයට අදළ සමාජ-ආර්ථික පර්යේෂණ කිරීම.

ඊ. කෘෂිකාර්මික පර්යේෂණ ක්ෂේත්‍රයට අදළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පහසුකම් සැපයීම සහ ආයතනය තනිවම හෝ අනෙකුත් ආයතනවල සහයෝගය ඇතිව ඩිප්ලෝමා, උපාධි, ත්‍යාග සහ සම්මාන සහතික පිරිනැමීම.

උ. ගොවිකටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීම්වලට සම්බන්ධ සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම සහ ඒ සඳහා අනුග්‍රහය දැක්වීම.

ඌ. ආසියාතික රටවල සහයෝගය ඇතිව කලාපීය අවශ්‍යතාවයන් වෙනුවෙන් කෘෂිකාර්මික ව්‍යුහාත්මක ප්‍රශ්න ගැන පර්යේෂණ කිරීම සහ තොරතුරු එක්රැස් කර බෙද හරින මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

එ. ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ආසියානු රටවල කෘෂිකර්මාන්තය සංවර්ධනය සහ නවීකරණය සම්බන්ධ ගැටළු කෙරෙහි පර්යේෂණ යොමු කිරීම.

ඉහත අරමුණු ප්‍රධාන වශයෙන් කොටස් 04 කට සාරාංශ කළ හැකිය.

1. ගොවිජන හා ග්‍රාමීය ක්ෂෙත්‍රයේ ගැටළු සම්බන්ධ පර්යේෂණ පැවැත්වීමට සහායවීම සහ එකී පර්යේෂණ සම්බන්ධීකරණය කිරීම.
2. ගොවිජන හා ග්‍රාමීය ක්ෂෙත්‍රයේ ගැටළු සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම.
3. ගොවිජන හා ග්‍රාමීය ක්ෂෙත්‍රය සම්බන්ධව සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම
4. ගොවිජන ක්ෂෙත්‍රයට අදළ තොරතුරු රැස්කර බෙද හැරීම.

2008 වසර අවසාන වන විට ආයතනය විසින් පර්යේෂණ අධ්‍යයනයන් 400කට වැඩි ප්‍රමාණයක් නිම කොට ඇත. ආයතනය පිහිටවනු ලැබූ මුල් අවධියේ දී වැඩි අවධානයක් යොමු වූයේ ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව වැනි ආයතනය සහ ඇමරිකාවේ කෝ(ර්)නෙල් විශ්ව විද්‍යාලය, නෙදර්-ලන්තයේ වා(ර්)ගලින්ගන් විශ්ව විද්‍යාලය වැනි ආයතන සමඟ සම්බන්ධ වී ශ්‍රී ලංකාවේ ගොවි ගැටළු ගැන අධ්‍යයනය කිරීමයි. එවැනි පර්යේෂණ බොහෝමයක දී විදේශීය පර්යේෂකයන් ආයතනය තුළ සේවය කරන ලදී. සමාජ-ආර්ථික පර්යේෂණ පැවැත්වීමට සුදුසු වාතාවරණයක් සහ පහසුකම්වලින් ආයතනය පරිපූර්ණ වී ඇති බැවින් දේශීය හා විදේශීය ආයතන මෙම ආයතනයත් සමඟ බද්ධ වී පර්යේෂණ කිරීමට වැඩි කැමැත්තක් දක්වයි. 1980 දශකයේ ගල්ඔය වාරි ව්‍යාපාරය සම්බන්ධ කර ගෙන ජල කළමනාකරණය පිළිබඳ ව්‍යාපෘතියක් ඇමරිකාවේ කෝ(ර්)නෝල් විශ්ව විද්‍යාලය සම්බන්ධ වී ක්‍රියාත්මක කරන ලදී. ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගය ඇතිව කිරිඳිඔය ව්‍යාපාරය පිළිබඳ සමාජ-ආර්ථික සමීක්ෂණ ගණනාවක් පවත්වන ලදී. ආයතනයේ මුල් කාලයේ කරනු ලැබූ පර්යේෂණවල මූලික පරමාර්ථය වූයේ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය තොරතුරු රැස් කිරීමයි. 1970 සහ 1980 දශකයේ ප්‍රතිපත්ති සම්පාදකයින්ට අවශ්‍ය තොරතුරු සඳහා වැඩි ඉල්ලුමක් පැවතුණි.

මෙයට අමතරව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන්ගේ උපාධි සහ පශ්චාත් උපාධි පර්යේෂණ අධ්‍යයනයන් සඳහා ආයතනය මඟින් සැළකිය යුතු දයකත්වය ලබා දේ. ආයතනයේ පර්යේෂකයන් බාහිර උපදේශකයන් වශයෙන් සහ බාහිර පරීක්ෂකවරුන් වශයෙන් කටයුතු කරන බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. ඊට අමතරව බාහිර කථිකාචාර්යවරු වශයෙන් ද සේවය කරති. විශ්වවිද්‍යාල තුළින් ඉවත්වන උපාධිධාරීන් මෙම ආයතනයේ ක්ෂෙත්‍ර පර්යේෂණවල දත්ත රැස් කරන්නන් වශයෙන් ද ක්‍රියා කරනු ලබයි.

ආයතනයේ ගෙවී ගිය දශකය තුළ වැඩි අවධානයක් යොමු වූයේ ආයතනය විසින්ම ගොවි ගැටළු සම්බන්ධ පර්යේෂණ පැවැත්වීමට යි. පර්යේෂණ නිලධාරීන් සිය ක්ෂෙත්‍ර අධ්‍යයනවල දී හඳුනාගත් ගැටළු, ආයතනයේ පාලක මණ්ඩලය විසින් හඳුනාගත් ගැටළු සහ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතනවල නිලධාරීන් හඳුනාගත් ගැටළු මෙම පර්යේෂණ සඳහා පාදක විය. වී, අතිරේක භෝග, එළවළු සහ පළතුරු නිෂ්පාදනයේ දී හා අලෙවියේ දී ගොවීන් මුහුණපාන ගැටළු පිළිබඳ පර්යේෂණ ගණනාවක් පවත්වා තිබේ. මෙම පර්යේෂණ පැවැත්වීමේ දී, පර්යේෂකයින්ගේ පර්යේෂණාගාර වන්නේ ගොවි ගම්මානයන්ය. අධ්‍යයන ගැටළුවලට අදළ වඩාත් යෝග්‍ය ගොවි ප්‍රදේශ තෝරාගෙන එකී ප්‍රදේශවලින් අහඹු ලෙස ගොවීන් තෝරාගෙන ඔවුන්ගේ නිවෙස්වලට ගොස් ප්‍රශ්න මාලා ඔස්සේ තොරතුරු රැස් කිරීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණවල විශේෂත්වය වේ. මෙහි

දී පර්යේෂණ කණ්ඩායම විසින් ද, එකී ගම්මානවල සැරි සරමින් නිරීක්ෂණය සහ සාකච්ඡා මඟින් තොරතුරු රැස් කරනු ලබයි. එසේ රැස් කළ තොරතුරු ආයතනය තුළ දී පරිඝනක තුළින් විශ්ලේෂණය කොට ගැටළුව පිළිබඳ මනා අවබෝධයක් ලබාගෙන ගැටළුව විසඳීමට අවශ්‍ය ක්‍රමෝපායයන් ඉදිරිපත් කෙරේ. ගැටළුවක් විසඳීමේ දී, ගැටළුව හරියාකාරව හඳුනා ගැනීම ඉතා වැදගත් ය. මෙහි දී, ආයතනයේ පර්යේෂකයෝ ගැටළුව කුමක් ද ? ගැටළුව ඇතිවූයේ කවද ද ? ගැටළුව ඇතිවූණේ කවර ස්ථානයක ද ? ගැටළුව ඇතිවූයේ ඇයි ? ගැටළුව නිසා ඇති වී ඇති ප්‍රතිවිපාක කවරේද ? යනා දී වශයෙන් විවිධ පැති ඔස්සේ ගැටළුව විශ්ලේෂණය කරති. ඈත පිටිසර ගොවි ගම්මානවල පවතින ගොවි ගැටළු පිළිබඳ මනා අවබෝධයක් ඇති පර්යේෂක කණ්ඩායමක් ආයතනයේ සේවය කරති.

ගොවි ගැටළු අලලා සම්මන්ත්‍රණ වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම ආයතනයේ තවත් වැදගත් කාර්යයකි. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ආයතනයේ මානව සම්පත් සහ ආයතනික සංවර්ධන අංශය නමින් වෙනම අංශයක් පිහිටුවා ඇත. පසුගිය 37 වසරක කාල පරිච්ඡේදය තුළ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් 250ක් පමණ පවත්වා ඇත. 2007 වර්ෂයේ අසාමාන්‍ය ලෙස සහල් මිල ඉහළ යෑම පිළිබඳ ගොවීන්, මෝල් හිමියන්, තොග සහ සිල්ලර වෙළඳුන්, ආනයනකරුවන්, පාරිභෝගිකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් යන සියළුම පාර්ශවයන් කැඳවා වැඩමුළුවක් පවත්වන ලදි. එම වැඩමුළුව තුළින් සහල් මිල ඉහළ යාමට හේතු සහ අනාගතයේ දී එවැන්නක් ඇති නොවීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා ඉදිරිපත් විය. 2008 වර්ෂයේ දී පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ මූල්‍ය ආධාර ඇතිව අලෙවිකරණ ව්‍යාප්ති සේවය පිළිබඳ පුහුණු පාඨමාලාවක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ව්‍යාප්ති නිලධාරීන් සඳහා පවත්වන ලදි. වෙළඳපොළ පදනම් කරගත් නිෂ්පාදන රටාවක් ඇති කිරීම සඳහා අවශ්‍ය දැනුම මෙමඟින් ව්‍යාප්ති නිලධාරීන්ට ලබා දෙන ලදි. වගා කළ යුතු භෝගය ?, වගා කළ යුතු කාලය ?, විකිණිය යුතු කාලය ?, විකිණිය යුතු ආකාරය ?, විකිණිය යුත්තේ කාට ද ? සහ ඉහළ මිලක් ලබා ගත හැක්කේ කෙසේ ද ? යන කරුණු පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමට අවශ්‍ය දැනුම මෙම පාඨමාලා තුළින් ව්‍යාප්ති නිලධාරීන්ට ලබා දෙන ලදි. නිෂ්පාදනය පදනම් කරගත් ව්‍යාප්ති සේවය තුළට අලෙවිකරණ ව්‍යාප්ති සේවය ද බද්ධ කළ යුතුය. නිෂ්පාදනය ඉලක්ක කර ගත් ව්‍යාප්ති සේවය තුළින් නිෂ්පාදන කාර්යක්ෂමතාවට අවශ්‍ය උපදෙස් ලබා දෙන අතර අලෙවිකරණ ව්‍යාප්ති සේවය තුළින් අලෙවිය කාර්යක්ෂම කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙයි.

ගොවිජන ක්ෂෙත්‍රයට සම්බන්ධ තොරතුරු රැස් කර බෙද හැරීම සඳහා කෘෂිකාර්මික දත්ත බැංකුවක් සහ අලෙවි තොරතුරු සේවාවක් ක්‍රියාත්මක වේ. ඇමරිකානු එක්සත් ජනපද සංවර්ධන වැඩසටහන යටතේ 1975 වර්ෂයේ දී කෘෂිකාර්මික දත්ත, එකම ස්ථානයකින් ලබාදීමේ අරමුණ ඇතිව කෘෂිකාර්මික දත්ත බැංකුව පිහිටුවන ලදි. ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැනි විවිධ දෙපාර්තමේන්තු සහ ජාතික පොහොර ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා මහ බැංකුව වැනි ආයතන මඟින් එකතු කරනු ලබන දත්ත මෙහි තැන්පත් කොට ඇත. අවශ්‍ය අයට අවශ්‍ය ආකාරයට අවශ්‍ය වේලාවට ලබාදීම සඳහා සියළු දත්ත පරිඝනක ගත කර තිබේ. විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතනවල නිලධාරීන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සහ ශිෂ්‍යයින්, දේශීය සහ විදේශීය විශේෂඥයින් දත්ත බැංකුවෙන් තොරතුරු ලබා ගැනීම සිදු කරනු ලබයි.

ඇමරිකානු එක්සත් ජනපද ආධාර ඇතිව 1978 අලෙවි තොරතුරු සේවාව ආරම්භ කරන ලදි. එම කටයුතු සාර්ථකව කර ගෙන යාම සඳහා අවශ්‍ය අලෙවි පර්යේෂණ ඒකකයක් (දැනට අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය ලෙස හඳුන්වයි) ස්ථාපනය කරන ලදි. මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ කෘෂිකාර්මික වෙළඳපොළ ක්‍රියාකාරීත්වය පිළිබඳ නිරන්තර පරීක්ෂා කර වෙළඳපොළ කාර්යක්ෂමතාව සඳහා අවශ්‍ය උපදෙස්

ලබාදීමයි. මෙම කාර්යය ඉටු කිරීම සඳහා කොළඹ, මහනුවර, දඹුල්ල, මීගොඩ, නාරාහේන්පිට වැනි වෙළඳපොළවල්හි තොග මිල ගණන් දිනපතා රැස් කරනු ලබන අතර සිල්ලර මිල ගණන් සතියකට වරක් දිවයිනේ තෝරා ගත් වෙළඳපොළවල් 40 කින් එකතු කරනු ලබයි. එසේ එකතු කරන තොරතුරු විශ්ලේෂණය කොට ආහාර ද්‍රව්‍ය විවරණිකාව හරහා සතිපතා ප්‍රසිද්ධ කර බෙද හැරේ. ඊට අමතරව, විද්‍යුත් මාධ්‍ය හරහා ද මිල තොරතුරු ප්‍රචාරය කරනු ලැබේ. තව ද, නිෂ්පාදන තොරතුරු, ආනයන තොරතුරු සහ මිල තොරතුරු විශ්ලේෂණය කර "ආහාර තොරතුරු විවරණිකාව" හරහා මාසිකව ප්‍රසිද්ධ කර බෙද හරිනු ලැබේ. ලෝක ආහාර සහ කාෂිකර්ම සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණ ආධාර යටතේ අලෙවි තොරතුරු සේවාව වඩාත් කාර්යක්ෂම කරන ලදි. බුරුමය සහ කාම්බෝජය යන රටවලින් නියෝජිතයින් පැමිණ එම රටවල අලෙවි තොරතුරු සේවාවක් ඇති කිරීම සඳහා අපගේ සේවාව පිළිබඳ අධ්‍යයනය කරන ලදි. අලෙවි තොරතුරු එක් රැස් කර බෙද හැරීම සම්බන්ධයෙන් ආයතනයට විශාල පිළිගැනීමක් මේ වන විට ලැබී තිබේ.

ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ පර්යේෂණ තුළින් දැනුම ජනනය කර බෙද හැරීමයි. පර්යේෂණ තුළින් ලබා දෙන තොරතුරු පදනම් කර ගෙන තිරසාර කෘෂිකර්මාන්තයක් සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව සහ ප්‍රතිපත්ති සම්පාදකයන් අතර තොරතුරු හරහා සම්බන්ධීකරණයක් ගොඩ නැඟීමේ ක්‍රියාවලියක ආයතනය නිරත වී සිටී. පසුගිය තිස්හත් වසරක කාලය තුළ එම කාර්යය මෙම ආයතනය මඟින් හැකි පමණින් ඉටු කොට ඇත. කෙසේ වෙතත්, එය සෑහීමකට පත් විය හැකි තත්ත්වයක් නොවේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය, කෘෂි ව්‍යාපාර ලෙස සංවර්ධනය කිරීම අවශ්‍ය වී ඇත. ඒ සඳහා කාර්යක්ෂම නිෂ්පාදන හා අලෙවි ක්‍රියාවලියක් ස්ථාපනය කළ යුතුය. ඒ තුළින් පාරිභෝගිකයින්ට අවශ්‍ය භාණ්ඩය, අවශ්‍ය ආකාරයට, අවශ්‍ය වේලාවට, අවශ්‍ය ස්ථානයට ලබාදීමට හැකියාව ලැබේ. මේ සඳහා වෙළඳපොළ අවශ්‍යතාවන් හඳුනාගෙන ඒ අනුව නිෂ්පාදනය සැලසුම් කළ යුතුය. මේ සඳහා නිෂ්පාදනය හා අලෙවිය එකිනෙකට සම්බන්ධ වීම අත්‍යාවශ්‍යය. නිෂ්පාදනය හා අලෙවිය එකම කාසියක දෙපැත්ත වැනිය. මෙවැනි තත්ත්වයක් ඇති කිරීමට නම් දේශීය කෘෂිකර්මාන්තයේ විප්ලවීය වෙනසක් ඇති කළ යුතු වේ. පළමු කෘෂිකාර්මික විප්ලවයේ දී (හරිත විප්ලවය) එලදාව තුළින් නිෂ්පාදනය වැඩි කිරීමට කටයුතු කළා සේ දෙවන කෘෂිකාර්මික විප්ලවයේ දී කාර්යක්ෂමතාව තුළින් ලාභය වැඩිකර ආදායම වැඩි කිරීමට කටයුතු කළ යුතුය. පළමු කෘෂිකාර්මික විප්ලවයේ දී කෘෂි විද්‍යාඥයින් විශාල කාර්යභාරයක් ඉටු කළා සේ දෙවන කෘෂිකාර්මික විප්ලවයේ දී සමාජ විද්‍යාඥයින් විසින් විශාල කාර්ය භාරයක් ඉටු කළ යුතුව තිබේ. මේ සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට විශාල කාර්යයක් පැවරී ඇත. එම භාරදූර කාර්යය දැනටමත් අවබෝධ කරගෙන ඒ සඳහා අවශ්‍ය කටයුතු ආයතනය මඟින් සූදානම් කරමින් සිටී. ආයතනයේ දැක්ම, මෙහෙවර ඒ අනුව සකස් කර පස් අවුරුදු සැලැස්මක් 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරගෙන යයි. සෑම වසරක් අවසානයේදීම පර්යේෂණ ප්‍රතිඵල ප්‍රතිපත්ති සම්පාදනයට ලබාදීම සඳහා වැඩමුළුවක් පැවැත්වේ. 2008 වර්ෂයේ එය ආරම්භ කරන ලදි.

2009-2013 නව සංගත සැලසුම ක්‍රියාත්මක කෙරෙන කාල පරිච්ඡේදයයි. සමාජ-ආර්ථික පර්යේෂණ ක්ෂේත්‍රයේ නිම් වළලු පුළුල් කරමින් නව ජවයකින් හා නව පිබිදීමකින් අනාගතයට පිවිසෙන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 37 වෙනි සංවත්සරය සැමරුමේ දී, ඓතිහාසික මෙහෙවරක නියැලී සිටින බැව් අභිමානයෙන් සඳහන් කරමින් මෙම සටහනට විරාමය තැබෙයි.

**ආචාර්ය එල්.පී. රූපසේන**
*නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)*
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය